# සිදත්සඟරාව; මහාචාර්ය විජයසූරිය විග්‍රහය පිළිබඳ අධ්‍යයනයක්

**ඉන්දිකා අනුරින් දිවාකර**

***Sidath Sangarawa*** was written by ***Ven. Pathiraja Piruvanpathi Thero*** in the 13th Century and in this book, he built the structure of Sinhala grammar based on the knowledge that he gained from studying the books titled ***Asakdakava, KavSulumina,*** and ***Muvadewdawatha*** which were written in the pure ÉLU Sinhala language. Each and every structural pattern of Sinhala grammar that he discovered in the process of scrutinizing the above-mentioned texts were descriptively explained and supported by examples in the first chapter. Also, the most significant grammar structures and the frequently-used grammar structures were separately analyzed in separate chapters as well. Accordingly, all the grammar patterns that were described in the ***Sidath Sangarawa*** were allocated separate chapters as ***Sandhi, Linga, Vibhakthi, Samasa, Visheshana, Visheshya, Kriya, Prathyartha,*** subject, accusative form, voice etc. Though the grammar rules are different to in each component, there is cohesion or an inter-relationship among their systems or structures. In addition, the author has compiled two extra chapters to analyze ***ishtanishta*** and ***alankara*** used in Sinhala poetry. All the aforesaid grammar rules were analyzed by employing the methods called ***"jeka prayogaya"*** and ***"vyavaharaya"***

He reiterated the perspectives and the viewpoints of the senior academics and prescribed a particular

© ඉන්දිකා අනුරින් දිවාකර

සංස්. ආචාර්ය පූජ්‍ය මීමුරේ ගුණානන්ද හිමි, මහාචාර්ය ඊශා හේවාබෝවල, මහාචාර්ය සුසන්ත මහඋල්පත, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රියංකර රත්නායක

**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 20 කලාපය, 2012/13, මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය**

stance to the new learners while clearly establishing the same as his own standpoint. Also the instructions were set out for the youngsters to take both the aspects of old scholars and the existing usages of the language into the exploration at an issue on language rules. Various criticisms have been developed regarding the Sinhala grammar structures explained in ***Sidath Sangarawa*** in 20th Century. Among these the analysis brought out by Prof. Wimala Wijesuriya is significant because he analyses the grammar, methodology, association of other languages, alphabet and gender classification explained in ***Sidath Sangarawa*** based on the perspectives of historical linguistics. Language corpus planning brought to light the theories of the ***Sidath Sangarawa*** relevant to Sinhala grammar and the analysis presented by Prof. Wimala Wijayasuriya. **The author of *Sidath Sangarawa* has compiled a grammar book so as to fulfill a current language requirement of the society An alphabet and gender analysis were brought to light in ELU Sinhala securing the identity of the Sinhala Nation is extremely significant.**

**සිංහල භාෂාවේ ව්‍යාකරණ රීති ඉගෙන ගන්නා** නවක විද්‍යාර්ථීන් වෙනුවෙන් සම්පාදිත **සිදත්සඟරාව දහතුන් වන සියවසේ දී පතිරාජ පිරුවන්පති** නම් හිමි නමක් විසින් සම්පාදනය කරන ලද්දකි. (**සිදත්සඟරා විස්තර සන්නය.**, 1902, 1, 231.) ග්‍රන්ථ කතුවරයා විසින් අමිශ්‍ර (හෙළු) සිංහල භාෂාවෙන් (ජේක ව්‍යවහාරයෙන්) හඳුනාගන්නා ලද ව්‍යාකරණ විධි විස්සක් **සිදත්සඟරාවට** ඇතුළු කොට තිබේ. ඊට අමතරව කාව්‍ය භාෂාවට වැදගත් වන ඉෂ්ටානිෂ්ට හා අලංකාර ග්‍රන්ථයේ අවසානයට වෙන ම පරිච්ඡේද දෙකක් වශයෙන් ඇතුළු කිරීමට පෙළඹී ඇත. (**සිදත්සඟරා විස්තර සන්නය.**, 1902.) **සිදත්සඟරාවේ** ව්‍යාකරණ විධි විස්සම විග්‍රහයට හසු නොකළ ද **සිදත්සඟරා** කතුවරයාගේ **ව්‍යාකරණ විග්‍රහයේ ක්‍රමවේදය, වෙනත් ජ්‍යෙෂ්ඨ භාෂා ආශ්‍රය, අක්ෂර මාලාව හා ලිංග භේදය** ඓතිහාසික වාග්විද්‍යාත්මක විග්‍රහයට හසුකළ වාග්වේදියකු ලෙස මහාචාර්ය විමල විජයසූරිය හඳුන්වා දිය හැකිය. එබැවින් මේ අධ්‍යයනයේ

අරමුණ වන්නේ **සිදත්සඟරා කතුවරයාගේ ව්‍යාකරණ විග්‍රහයේ ක්‍රමවේදය, වෙනත් ජ්‍යෙෂ්ඨ භාෂා ආශ්‍රය, අක්ෂර මාලාව හා ලිංග භේදය** සමඟ විජයසූරියගේ ඓතිහාසික වාග්විද්‍යාත්මක විග්‍රහය සමාජවාග්විද්‍යාත්මක ව සංක්ෂිප්ත වූ තුලනාත්මක අධ්‍යයනයකට හසු කිරීමයි.

සිංහල භාෂාවේ ව්‍යාකරණය ඉගෙන ගැනීමට **සිදත්සඟරාවේ** ව්‍යාකරණ ප්‍රයෝග ප්‍රමාණික නොවන බවට විසිවන සියවසේ දී ප්‍රතිමතවාද ගොඩනැගුණි. ඩබ්ලියු. එෆ්. ගුණවර්ධන එහි පුරෝගාමිත්වය උසුලන අතර කුමාරතුංග මුණිදාස ඊට ප්‍රබල සම්මතකරණයක් ගොඩනැගුවේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් දීර්ඝ කාලයක් සිංහල භාෂාවේ ව්‍යාකරණය ඉගෙන ගැනීමේ අත්පොත වශයෙන් පැවැති **සිදත්සඟරාව** සිංහල භාෂාවේ ව්‍යාකරණය ඉගෙන ගැනීමට ප්‍රමාණික හා ප්‍රමාණවත් නොවන ව්‍යාකරණ කෘතියක් වශයෙන් වර්ගීකරණයකට හසුවිය. මෙයින් සිදු වූ ප්‍රබල කරුණක් වන්නේ **සිදත්සඟරාවේ** ව්‍යාකරණ ප්‍රයෝග පිළිබඳව විවිධ මතවාද ගොඩනැගීමයි. එබැවින් විසිවන සියවසේ දෙවන දශකයෙන් මෙපිට කාලය '**සිදත්සඟරා මතවාදත්මක යුගයක්**' ලෙස ද නම් කළ හැකිය. මතවාදාත්මක යුගයට අයත් එමෙන් ම **සිදත්සඟරාවේ ව්‍යාකරණ විග්‍රහයේ ක්‍රමවේදය, වෙනත් ජ්‍යෙෂ්ඨ භාෂා ආශ්‍රය, අක්ෂර මාලාව හා ලිංග භේදය** යන ව්‍යාකරණ රීති ඓතිහාසික වාග්විද්‍යාත්මක විග්‍රහයකට හසුකළ වාග්වේදියකු ලෙස මහාචාර්ය විමල විජයසූරිය මෙහි දී වැදගත් වෙයි.

## 1. සිදත්සඟරාවේ ව්‍යාකරණ විග්‍රහයේ ක්‍රමවේදය

මහාචාර්ය විජයසූරියගේ **සිදත්සඟරාවේ** ව්‍යාකරණ රීති විග්‍රහයේ ප්‍රධාන ක්‍රමවේද තුනක් හඳුනාගත හැකිය. ඒ **සිදත්සඟරාවේ** වැදගත්කම පෙන්වා දීම, **සිදත්සඟරාවේ** ව්‍යාකරණ රීති පිළිබඳ ව ලියැවී ඇති විවිධ විචාර ග්‍රන්ථ හා ලිපි ලේඛනවලින් **සිදත්සඟරාවේ** ව්‍යාකරණ රීති පද්ධතිය පිළිබඳ ව මතභේදාත්මක තත්ත්වයක් ගොඩනැගී ඇතැයි දැක්වීම හා මේ ඇසුරෙන් තම මතාකල්ප තහවුරු කිරීමට උත්සාහ දැරීමයි. '**සිදත් සඟරාව** සිංහල භාෂාවෙන් ලියැවුණු පුරාතන, අවශිෂ්ට එක ම ව්‍යාකරණ ග්‍රන්ථය වීම නිසා එය අගනා විෂය ග්‍රන්ථයක් වෙයි'. (විජයසූරිය, 2002: 72) 'අගනා විෂය ග්‍රන්ථයක්' යැයි සඳහන් කරමින් **සිදත්සඟරාවේ වටිනාකම** ඉස්මතු කොට

දක්වන විජයසූරිය **සිදත්සඟරාව** විෂයයීකව තම ප්‍රථම මතාකල්පය ගොඩනගා ඇත්තේ '**අනුරූ සේපියොනන්**' (**සිවිස**, 1902: 4) එනම් ඡේක ප්‍රයෝග මාතෘකා කොටගෙනය. මේ සිද්ධාන්තයට ගරු කරන්නා වූ සම්ප්‍රදායයේ සැලැස්ම වන්නේ ජ්‍යෙෂ්ඨ භාෂාවල ඒ වර්ගයට අයත් කෘති හැකිතාක් දුරට අනුකරණය කිරීම හා ඊට අනුගතව ව්‍යාකරණ රීති දැක්වීම බව සඳහන් කොට ඇත්තේ ඒ සිරිත මේ විෂයයට බලපා ඇති බැවින් එයින් ස්වාධීන ලෙස භාෂාව විග්‍රහයට ඇති අවකාශ ඇහිරෙන බව ද ඉදිරිපත් කරමිනි. මේ නිසා භාෂාව ස්වාධීනව විග්‍රහ කිරීමේ පහසුව වෙනුවෙන් වාග්වේදීන් 'Linguistic' (වාග්විද්‍යාව) ලෙස අලුත් විෂයයක් නිපද වී යැයි සඳහන් කරමින් ඊට අනුගත ව භාෂාව හා වාග්විද්‍යාව පිළිබඳ ව කරුණු දක්වා ඇත්තේ පහත ආකාරයටය.

> ''මෙ බඳු නොයෙකුත් දුබලකම් නිසා භාෂාවක් ක්‍රමවත් ව හැදෑරීමට අපහසු නිසයි නවීන විද්‍යාඥයන් වඩාත් විධිමත් ලෙස භාෂාවන් හැදෑරීමේ පහසුව සලකා වාග් විද්‍යා (Lingustic) නමින් අළුත් විෂයයක් නිපදවන ලද්දේ. වාග් විද්‍යා මූලධර්ම අනුව භාෂාව යනු 'සේ පියෝනන්' (පණ්ඩිත ඡේක ප්‍රයෝග) නොවේ. ව්‍යාකරණයෙහි භාෂාව යනුවෙන් අගය කරන්නේ පඬිවරුන් කවීන් ලියන කියන ක්‍රමයයි. වැඩි වශයෙන් ම ඔවුන් ලියන ලද ක්‍රමයයි. එය වාග් විද්‍යානුකූලව සලකන විට භාෂාවක නොවටනාම පැත්තයි. පඬුවන් භාෂාව හැටියට ලියන්නේ 'හදාගත්' (කෘත්‍රිම) භාෂාවකි. නැතහොත් යල් පැනපු (මැරීගිය) භාෂාවකි. සමාජයේ සහජීවනය සඳහා බෙහෙවින් උපකාර වන පොදු භාෂාව නම් නො වේ. පණ්ඩිත භාෂාව ව්‍යාකරණ පොත්වලින් ඉගෙන ඒ ඒ සමාජයෙහි දී අපේ ඕනෑ එපාකම් කීමට හෝ ගනුදෙනු කර ගැනීමට හෝ නොහැකි ය. අපේ ව්‍යාකරණයත් නූතන විග්‍රහාත්මක වාග්විද්‍යාවත් දෙක එකිනෙක වෙනස් සළුල දෙකක් මත උපන් බව පැහැදිලිවේ...'' (විජයසූරිය, 2002: 72-73).

**සිදත්සඟරා** කර්තෘගේ සිද්ධාන්ත දැක්වීමේ මෙන් ම භාෂාව විග්‍රහ කිරීමේ ක්‍රමවේදය මෙසේ ප්‍රතික්ෂේප කරන මහාචාර්ය විජයසූරියගේ වැදගත් ප්‍රකාශයක් වන්නේ භාෂාව ඓතිහාසික දෘෂ්ටියෙන් විමර්ශනය කිරීමෙහිලා සෙල්ලිපි හා උගතුන් ලියන ලද සාහිත්‍ය ග්‍රන්ථමාලාව වැදගත් වන බව සඳහන් කොට තිබීමයි. එනම් ඡේක ප්‍රයෝග හා ව්‍යවහාරයම විමල විජයසූරිය සම්මතකරණය කොට තිබේ.

**සිදත්සඟරාව** ඓතිහාසික වාග්විද්‍යාත්මක දෘෂ්ටිකෝණයට හසුකොට විමසීමෙන් විජයසූරියගේ අදහස් කාලීන සමාජය ප්‍රස්තුතව වැදගත් වුවත් **සිදත්සඟරා** කතුවරයා විසින් තම අරමුණු සාර්ථක කර ගැනීමට යොදාගන්නා ලද 'අනුරූ සේපියෝනන්' (**සිදත්සඟරා විස්තර සන්නය**, 1902: 4) ක්‍රමවේදය කාලීන සමාජ සංසිද්ධි හමුවේ ඒ මතවලට වඩා ප්‍රබලය. ඒ සමාජවාග්විද්‍යාවෙන් **සිදත්සඟරා** කතුවරයාගේ මුඛ්‍යාභිලාෂය වැදගත් කොට සැලකීමට එළියක් ලැබෙන හෙයිනි. එනම් කාලීන සමාජයේ විවිධ සිදුවීම් කෙරෙහි ද අවධානය යොමු කිරීමෙනි. දේශපාලන, සමාජ හා සංස්කෘතික වශයෙන් ශ්‍රී ලාංකික සමාජය ප්‍රබල පරිහාණියක පැවැති අවදියක, වටිනා ග්‍රන්ථ විනාශ කොට තිබූ අවස්ථාවක උගත් පිරිස දුර්ලභ වූ වකවානුවක (*Chülavamsa*.1925) සිංහල ජාතියේත්, භාෂාවේත් අනන්‍යතාව ආරක්‍ෂා කරදීමට **සිදත්සඟරා** කතුවරයාට හැකිවීම එහිලා කැපී පෙනෙයි. දඹදෙණි යුගය වන විට සංස්කෘත, පාලි භාෂා සමාජ වියත් මතයෙන් පිළිගැනුණු භාෂා බවට කරුණු වෙයි. වාග්විද්‍යාත්මක භාෂා විග්‍රහයට අනුව කාලීන භාෂාව ඇසුරෙන් **සිදත්සඟරාව** සම්පාදනය වූයේ නම් එය අමිශ්‍ර 'හෙළු' සිංහල භාෂාවේ ව්‍යාකරණය ලෙස අර්ථ ගැන්විය නොහැකි අතර 'සිංහල භාෂාවේ ව්‍යාකරණ කෘතිය' වශයෙන් නාමීකරණය කිරීම ද ගැටලු සහගත වන්නේ එහි සංස්කෘත, පාලි පමණකුදු නොව දෙමළ භාෂා ආශ්‍රයෙන් ගොඩනැඟෙන ව්‍යාකරණ ග්‍රන්ථයක් වීම පදනම් කොටගෙනයි. වර්තමානයේ වුව ද එවක රචනා වී ඇති ග්‍රන්ථ මෙන් ම පාලි, සංස්කෘත, දෙමළ ව්‍යාකරණ ග්‍රන්ථ ඇසුරෙන් ව්‍යාකරණ ග්‍රන්ථයක් සැකසිය හැකියි. එසේ වුවත් **සිදත්සඟරාව** නොවන්නට අමිශ්‍ර සිංහල, 'හෙළු සිංහල', සිංහලය පිළිබඳ ව, ජාතියේ අනන්‍යතාව, ස්වෛරීභාවය දැනට අප සතුව පවතින අමිශ්‍ර සිංහලයෙන් රචිත **කව්සිළුමිණ, එළුසඳැස්ලකුණ** වැනි ග්‍රන්ථ කිහිපයක ඇසුර ලබා ගොඩනැඟීම අසීරු කාර්යයක් වන්නේ සමාජ පසුබිම ද සැලකිල්ලට ගෙන **සිදත්සඟරාව** අධ්‍යයනයට හසුකිරීමේ දී ය. එබැවින් මෙහි දී පෙන්වා දිය හැකි වන්නේ භාෂාවේ නිරවද්‍යතාවත්, නවකයින්ට භාෂාවේ රීති මැනවින් ග්‍රහණය කරගැනීමේත්, ගැටලු විසඳා ගැනීමේත් නිවැරදිම ක්‍රමවේදය **සිදත්සඟරා කතුවරයා නිර්දේශකොට ඇති බවයි. ඒ පුරාණ ජේක, වියත් ව්‍යවහාරය හා කාලීන ජේක, වියත් ව්‍යවහාරයයි** (**සිදත්සඟරා විස්තර සන්නය**, 1902: 4, 5, 10, 50, 68, 64, 104).

## 2. වෙනත් ජෝෂ්ඨ භාෂා ආශ්‍රය

**සිදත්සඟරා** කතුවරයා වැඩි වශයෙන් ම '... වෙනත් ජ්‍යෝෂ්ඨ භාෂාවලට සැපයුණු ව්‍යාකරණ අංග හා තත්පාරිභාසික නාම රුචි කළ බව පෙනේ' (2002: 73) යැයි දක්වන විජයසූරිය **සිදත්සඟරාවේ** භාවිත ව ඇති 'ස්වරය පණකුරු ලෙසත්, ව්‍යඤ්ජනාක්ෂරය ගතකුරු ලෙසත් සැලකීම ආත්මවාදී ජෛන දර්ශනය ඔස්සේ ද්‍රවිඩයෙන් සිංහලයට ලැබුණු ආභාසයක් ලෙස පිළිගැනේ. නිපන්, තසම, තබව භෙදය, උපකාරක විභක්ති හා ගණල පස දාවීම ආදී භාෂා ලක්ෂණ හා එම ව්‍යාකරණ සිද්ධාන්ත ද ද්‍රවිඩ බලපෑම් පෙන්වා දෙයි' (2002: 73) වශයෙන් **සිදත්සඟරාවේ** ඇතුළුව ඇති වෙනත් භාෂා ආශ්‍රය ඉස්මතු කොට දක්වයි. එසේ ම සන් (සංඥා), සඳ (සන්ධි), ලිඟු (ලිංග), සමස් (සමාස) වැනි ව්‍යාකරණ විධි ද පාලි සංස්කෘතාදී වූ පැරණි ව්‍යාකරණ ග්‍රන්ථවල වූ පාරිභාෂික වචන මෙන් ම එකී වියරණාංග ද පෙන්වා දෙන බව සඳහන් කොට තිබේ. **සිදත්සඟරා** කතුවරයා මාගධ, සංස්කෘතාදී මව් භාෂා මෙන් ම දෙමළ භාෂාව ද කාලීන ව්‍යවහාරය ද යොදාගෙන **සිදත්සඟරාව** සම්පාදනය කොට තිබුණ ද ව්‍යාකරණඥයන්, වාග්විද්‍යාඥයන් ඇතුළු විචාරකයන් **සිදත්සඟරාව** ප්‍රස්තුත ව විවිධ ඌන නිර්දේශිතයන් ගොඩනැගුව ද වර්තමානයේ වුව ද සිංහල භාෂාවේ ව්‍යාකරණය පිළිබඳ සැලකීමේ දී මුල් වන්නේ ද භාවිත වන්නේ ද **සිදත්සඟරාවයි**.

දෙමළ භාෂා රීති ද ආශ්‍රය කොට ඇති බවට පැහැදිලි සාක්ෂ්‍ය **සිදත්සඟරාවෙන්** හමු වෙයි. එතකුදු වැදගත් වන්නේ **සිදත්සඟරා** කතුවරයා ඒ දැනුම ද උපයෝගී කොටගෙන සිංහල භාෂාවේ ව්‍යාකරණ සිද්ධාන්ත ඉදිරිපත් කිරීමත්, උදාහරණ දක්වා තිබීමත්ය. 'සකුසත් අනුසෙරෙන් ඇත ද... වහරට යුහු සිය බසැ...' (**සිදත්සඟරා විස්තර සන්නය**, 1902: 58, 7) යෙදීම් භාවිත කළත් සමහර සිද්ධාන්ත සිංහල ව්‍යවහාරයට ගැළපී නොමැති බව විජයසූරිය දක්වමින් තම ප්‍රතිමතය නිර්මාණය කොට තිබේ. තම මතාකල්පය සනාථ කිරීමට **සිදත්සඟරාවේ** සන්ධි, සමාස, ලිංග ආදි ව්‍යාකරණ රීති නිදසුන් වශයෙන් ගෙන පැහැදිලි කොට ඇත්තේ මෙසේය.

> ''සන්ධි විධිය සංස්කෘතයෙහි මෙන් සිංහලයෙහි ප්‍රධාන ස්ථානයක් දිය යුතු තරම් අනිවාර්ය ධර්මතාවක් නො වේ. ව්‍යවහාර සිංහලයෙහි වචන සන්ධි කොට භාවිත කිරීමට

වඩා විසන්ධි ව වැහැරීම ද දක්නා ලැබේ. සමාස ක්‍රමය පවා සිංහලයෙහි නොපැහැදිලි තත්වයෙක ය. සමහර අන් අරුත් සමස් පද, විබත් සමස් පද නිදසුන් වශයෙන් අලුතින් සොයාගන්නට ද නොහැකි තරම් ය. පද විභාගයේ දී පවා විබත්, වෙසෙසුන් හා ද - අරුත් සමස් කේවල සමස්ත පද වශයෙන් නො සලකා කඩා වෙන් කොට ලියනු සිරිත ය. සිදතේ ලිංග භෙදය ආදි බොහෝ කරුණු සලකන විට, (සිදතේ) ව්‍යාකරණ විධි හා ඒ පිළිබඳ සිද්ධාන්ත ක්‍රමය ද සිංහලට වඩා වෙනත් භාෂාවක ව්‍යාකරණ ක්‍රම අනුකරණය කරන ලද්දක් සේ පෙනේ'' (2002: 73).

මේ ආකාරයට **සිදත්සඟරාවේ** ව්‍යාකරණ දැක්වීම් වෙනුවෙන් තම ප්‍රතිවාදී මතාකල්ප ගොඩනැඟුවත් විජයසූරිය **සිදත්සඟරා** කර්තෘගේ ඇතැම් දැක්වීම් නොදැනුවත්වම හෝ සම්මත කරමින් තම ප්‍රතිමතයට වඩා **සිදත්සඟරා** දැක්වීම් ඉස්මතු කොට සම්මතකරණය කොට තිබීම කැපී පෙනෙයි.

''එහෙත් සිදත සියලු තන්හි දී ම වෙනත් භාෂා හා ව්‍යාකරණ සම්ප්‍රදායයන් අනුකරණය නො කරයි.

පාළි, සංස්කෘත, ද්‍රවිඩ ව්‍යාකරණවලට හෝ සිදත් කතුතුමා විසූ දඹදෙණි (ක්‍රි. 13 ශ. ව.) සමයට හෝ කොහෙත් ම සම්බන්ධ නොකළ හැකි විස්මය ජනක ඉගැන්වීම් (සිද්ධාන්ත) රාශියක් **සිදත්සඟරාවේ** ඇත.

1. පණකුරු පසක් ය යි මුලින් ම ප්‍රකාශ කොට යළිත් 'ලුහු ගුරු බෙයින් දස වේ' ය යි බෙදා දැක්වීම, හෝඩියට පසුවත් කෙවල (හුදුව) හා ගාත්‍රස්ථ (ගත් අරුණු) දීර්ඝස්වර යනුවෙන් නිදසුන් දෙවගයක් මඟින් එය සනාථ කිරීම.
2. පණකුරු වශයෙන් සිදතේ දැක්වුණු ස්වර මාලාවට ඇ, ඈ දෙක ඇතුළත් නොවීම හා මත් වැඩුමක් වශයෙන් ඇ ගැන කරන විධානය.
3. සමකාලීන හා පුරාතන භාෂාවේ බහුල වශයෙන් භාවිත වූ මහාප්‍රාණාක්ෂර ද සිදත් හෝඩියට ඇතුළු නොවීම.
4. කව් ලැකියෙහි හා ලෙව් ලැකියෙහි බින්දුව සපුරා උසුරුවන බවට නිදසුන් දක්වා බින්දුවේ අවශ්‍යතාව දැක්වීම.
5. ඒ සමඟ ම බින්දුව උනුමතින් (ඌන මාත්‍රායෙන්) කියවෙන බවට නිදසුන් දැක්වීම හා හෝඩියට ඇතුළත් නොවූ එකී ඌන මාත්‍ර සඤ්ඤකය මත් අඩුවේ දී දැක්වීම.
6. ලිංග භේදයේ දී සාමාන්‍ය අචෙතන නාම පුං - ස්ත්‍රී ලිංග ද්වයට ඇතුළු කොට සිංහලයේ ලිංග දෙකක් පෙන්වීම.''

මහාචාර්ය විජයසූරිය පූර්ව දැක්වීම්වලින් පසුව එළැඹී ඇත්තේ **සිදත්සඟරාව** පිළිබඳ තම මතය තහවුරු කිරීමටයි. ඒ;

> ''සිදත් සඟරාවේ එන මෙබඳු සිද්ධාන්ත රාශියකින් කිහිපයක් විමසීමෙන් ඒවා සිංහලයෙහි ඓතිහාසික භාෂා යුග කීපයක පුරාණ ව්‍යාකරණ සම්ප්‍රදායයන් මිස සිදත් කතුවරයා ගේ ව්‍යභිචාර දර්ශනයන් නොවන බව පෙන්වා දීම ද මෙහි අරමුණයි'' (2002: 74).

පූර්ව දැක්වීම් ද උපයෝගි කොටගෙන විජයසූරිය උත්සාහ ගෙන ඇත්තේ ඓතිහාසික භාෂා යුග කිහිපයක පුරාණ ව්‍යාකරණ සම්ප්‍රදායයන් ඇසුරෙන් හා වෙනත් ජ්‍යෙෂ්ඨ භාෂා ආශ්‍රයෙන් **සිදත්සඟරාව** සකසා ඇති බව පෙන්වා දීමටයි. ඊට **සිදත්සඟරාවේ** ඇතුළත් සිදත්, සදරුත්, විදි, සේ පියෝනන්, වහරනුසෙරෙන්, සිදු සේ, ඇදුරන්, උගහා, සේපා, ලැකියනුසෙරින්, සදතු දතු වහර නො ලඟනු ආදිය **සිදත්සඟරාවේ** ව්‍යාකරණ රීති දැක්වීමේ දී උපයෝගි කරගෙන විවිධ භාවිතයන් නිදසුන් වශයෙන් දක්වා ඇත. මෙයින් පුරාණ සම්ප්‍රදාය පිළිබඳ වූ ප්‍රතිපත්තිය ප්‍රකාශ වන බව විජයසූරියගේ ආකල්පය වන අතර ඒ පිළිබඳ සැලකුවහොත් පෙනී යන්නේ ද විජයසූරියගේ මතයේ සත්‍යතාවක් ඇති බවයි. (උදාහරණ - අංග, උපාංග සූත්‍රය හා ව්‍යාකරණ ප්‍රයෝග පැහැදිලි කිරීමේ දී යොදාගෙන ඇති නිදර්ශන) මේ පුරාණ සම්ප්‍රදාය ආරක්‍ෂා කිරීමේ ක්‍රමවේදය 'පුරාණ ස්ථිති ප්‍රවණතාව' ලෙස වාග්වේදීන් පෙන්වා දී ඇත. (Auto, 1973., Crystal, 1997., 1999., Milroy & Milroy 1999) **සිදත්සඟරාවේ** විග්‍රහ වන භාෂාව දඹදෙණි යුගයට වඩා පැරණි එකකැයි ඒ අනුව පෙන්වා දීමට ද විජයසූරිය උත්සාහ දරා තිබේ.

> ''සිදත්සඟරාව විග්‍රහ කළ භාෂාව දඹදෙණි යුගයට වඩා පැරණි එකකි. එහි උපුටා දක්වන ලද ව්‍යාකරණ ලක්‍ෂ්‍ය පාඨයන් ඇතුළත් සාහිත්‍ය ග්‍රන්ථ වැඩි කොටස විනෂට වන තරම් පැරැණි බව පෙනේ. පුරාණ සන්නය හඳුන්වා දෙන අසක්දා කව වැනි ව්‍යාකරණ ප්‍රමෙය ග්‍රන්ථ පැරැණි යුගයකට අයත් ය. අසක්දා මල ආදී දොළොස් මහ කවීන් විසූ ක්‍රි. 7 වන ශත වර්ෂයට අයත් විය හැකි ය. ඒ අනුව සිදතේ සමහර සිද්ධාන්ත වුවත් ක්‍රි. 7 ශ. වර්ෂයට හෝ ඉනුත් ඔබ්බට අයත් නැත හොත් අතිපුරාතන ඒවා වීමට නොබැරි ය'' (2002: 75).

**කව්සිළුමිණ** වැනි දඹදෙණි යුගයේ රචිත ග්‍රන්ථවල ආශ්‍රය ද ලැබී ඇති හෙයින් දඹදෙණි යුගය තෙක් කාව්‍ය හා ලෝක ව්‍යවහාරයේ ඇසුර ද **සිදත්සඟරා** කතුවරයා ලබාගෙන ඇති බැවින් '**සිදත් සඟරාව** විග්‍රහ කළ භාෂාව දඹදෙණි යුගයට වඩා පැරණි එකකි' ලෙස සඳහන් කොට තිබීම සැලකිය යුතු, විමර්ශනයට හසුවිය යුතු අදහසක් වුවත් **සිදත්සඟරාව** ඡේක ප්‍රයෝග හා ව්‍යවහාරාශ්‍රය ප්‍රධාන සිද්ධාන්තය කොටගෙන තිබීමෙනුත් **සිදත්සඟරාවේ** ඇතුළත් සූත්‍ර හා නිදර්ශන සැලකීමෙනුත් **සිදත්සඟරා** කතුවරයා විසින් වියතුන්ගේ ක්‍රමවේදය අනුගමනය කරන ලද බවත් වෙනත් භාෂා ආශ්‍රය ලැබූ බවත් පැහැදිලි වෙයි. කාලීන අවශ්‍යතාවක් වෙනුවෙන් ව්‍යාකරණ කෘතියක් සකසා ගැනීමේ දී ඉහත ක්‍රම දෙක ම අනුගමනය කිරීම අවශ්‍ය කාරණයකැයි සමාජවාග්වේදීන් ද පෙන්වා දී ඇත්තේ අවශ්‍ය කටයුතු සම්පූර්ණ කර ගැනීමට ඇතැම් විට ස්වකීය භාෂා ප්‍රයෝග ප්‍රාමාණික නොවන බැවිනි. (Nahir, Moshe. (1977), 107-123., (1984), 423-448).

### 3. අක්ෂර මාලාව හා ලිංග භේදය

තම මතය පෝෂණය කිරීමට මහාචාර්ය විජයසූරිය, **සිදත්සඟරා** කතුවරයා විසින් අනුරාධපුර යුගයට අයත් ශිලා ලේඛනත්, සාහිත්‍යයත් උපයෝගි කොට ගන්නා ලද බව ද සඳහන් කොට තිබේ. ඒ අතර සමකාලීන ව්‍යවහාරයේ වූ දීර්ඝ ස්වර ඇතුළු කිරීම සම්බන්ධයෙන් ද කරුණු දක්වා ඇත්තේ ඊට හේතු ද ඉදිරිපත් කරමිනි. (2002: 77) පූර්ව සමයෙහි දීර්ඝ ස්වර සංකේත භාවිතය ඇතිවීමට පෙර හ්‍රස්ව සංකේත ලියා අවශ්‍ය වූ විට උච්චාරණය කරන ලදැයි පෙන්වා දෙමින් විජයසූරිය, කුමාරතුංග මතයේ නිස්සාරත්වයන් යැයි තමන් සැලකූ කරුණු පෙන්වා දෙමින් සඳහන් කොට ඇත්තේ පූර්ව කාරණය නිවැරදිව වටහා නොගත් කුමාරතුංග **සිදත්සඟරාව** වරදවා තේරුම් ගෙන චෝදනාවට හසුකර ඇති බවකි. (2002: 78) ඒ අනුව ඇ, ඈ, ද ආරම්භයේ සිට හත්වන සියවස තෙක් භාෂාවේ නොවූ අකුරු දෙකකැයි පෙන්වා දෙන කතුවරයා හත්වන සියවස අවසානයේ යෙදෙන්නට වූ මේ අක්ෂර පොළොන්නරු, දඹදෙණි ශිලා ලිපි හා සාහිත්‍ය ග්‍රන්ථවල සුලභව භාවිත ව ඇතැයි සඳහන් කරමින් අ, ඇ බවට පත්වීමේ ස්වරූපය ද පැහැදිලි කොට ඊට උදාහරණ ද දක්වා ඇත. (2002: 78-79)

'ඇ', 'ඈ' අක්ෂර මාලාවට ඇතුළු නොවීමට හේතු රාශියක් මුල් වී ඇතැයි ඉදිරිපත් කරන විජයසූරිය හත්වන සියවස තෙක් භාෂාවේ පූර්ව අක්ෂර නොවූ බැවින් පොළොන්නරු, දඹදෙණි යුගය තෙක් ඒ සිද්ධාන්තවල පිහිටි හෙයින් **සිදත්සඟරා** හෝඩියට ද ඇතුළු කොට නොමැති බවට කරුණු දක්වා ඇත.

> ''ක්‍රි. 7 ශ. ව. තෙක් භාෂාවේ නොපැවැති අක්ෂර සංකෙතයක් එකල ලිඛිත හෝඩියට ඇතුළත් විය නොහැකි ය. එම ව්‍යාකරණ සිද්ධාන්තය පොළොන්නරු, දඹදෙණි යුග තෙක් ගරු කළ නිසා එම සංකේත දෙක සිදත් හෝඩියට ද ඇතුළත් නො වී ය. 'ඇ' සිදත් හෝඩියට ඇතුළු නොවීමටත්, නිදහස් ස්වරයක් ලෙස අගය නොකිරීමටත් ඓතිහාසික හේතු රාශියක් තිබේ'' (2002: 79).

**සිදත්සඟරා** කර්තෘගේ මාත්‍රා වෘද්ධි හා හානි ක්‍රමය පිළිබඳ ව කරුණු දක්වන විජයසූරිය **සිදත්සඟරාවේ** හා **පුරාණ සන්නයේ** දැක්වෙන මාත්‍රා වෘද්ධියක් හෝ හානියක් නොවුණ බව දක්වා ඇත්තේ **සිදත්සඟරා** කතුවරයා එසේ දැක්වීමට හේතු ද ස්ව ඥානයෙන් ඇතුළු කරමින්ය.

> ''මෙහි මත් යනු ඡන්දොවෘත්තගත ලඝු ගුරු මාත්‍රා නොවන නිසා, මත්, යන්නේ අර්ථය අනෙකක් විය යුතු ය. මත් යන්නේ මාත්‍රය - ප්‍රමාණය යන අර්ථය ද ඇත. එවිට මත් (ප්‍රමාණය) යනු උච්චාරණය - අකුරේ ශබ්දය සමඟ නොව එහි පද රූපය - සංකෙතය හා සම්බන්ධ ලක්ෂණයෙකි. මුල සිට භාෂාවේ නොතිබුණ විශෙෂ පිලි සංකෙත පසුව එක්වීම නිසා ලිඛිත අක්ෂරයේ ප්‍රමාණය වැඩෙයි. මෙහි දෙන ලද නිදසුන් තුන් වර්ගය වූ (1) ඇ පිල්ල, (2) හල් (කොඩි) ලකුණු (්) සහ (3) දීර්ඝ ස්වර දැක්වෙන පිලි. ක්‍රි. ව. 7 ශ. වර්ෂයට පෙර භාෂාවෙහි නොවූ දෑ ය. ඒවා භාෂාවේ අක්ෂරවලට එකතු වූයේ පසුව හෙයින් මත් (ප්‍රමාණයේ) වැඩීමක් ලෙස සලකා ඇත'' (2002: 81).

**සිදත්සඟරා** කතුවරයා විසින් 'මත්' යන්න අක්ෂරවල ප්‍රමාණයේ වැඩිවීමක් බව පෙන්වා දෙන ලදැයි විජයසූරිය සඳහන් කරන අතර 'ඇ' ආකාරයේ මත් වැඩීමක් ලෙස සැලකීමට තවත් හේතුවක් ද ඇතුළු කොට තිබේ.

> ''විශේෂයෙන් ම 'ඇ' අකාරයේ මත් වැඩුමක් ලෙස සැලකීමට තවත් හෙතුවක් තිබේ. එනම් 'ඇ' යන්න නිපැදුණේ අ යන්නේ රූපයෙන් වීමයි. .. උච්චාරණ ශබ්දය අනුව නම් ඇ යන්නේ මත් වැඩුම එන්නේ 'අ' යන්නෙන් නොව එයන්නෙනි. 'අ' අයන්නේ මත් වැඩුමෙකැයි සිදත කියන්නේ උච්චාරණය නොව ලිඛිත සංකෙත දෙස බලා ය. ඇ යන්නේ ඇ (ැ) පිල්ල හෙවත් ඇදය සඳහා මාත්‍රාංශයයි කියන්නේ ද අයන්නට එකතු කළ එම ලකුණු කැබැල්ලට ය. අ සහ ඇ සමාන වන්නේ ලිඛිත රූප වශයෙනි. ශබ්ද වශයෙන් නම් අ, ඉ, ඇ, එ මුළුමනින් එකිනෙක වෙනස් ස්වර ය'' (2002: 81).

ඒ අතර විජයසූරිය **සිදත්සඟරා** කතුවරයාට විෂය වී ඇත්තේ සිංහල භාෂාවේ '**ඓතිහාසික භාෂා යුග කීපයක පුරාණ ව්‍යාකරණ සම්ප්‍රදායක්**' යන තම මතය සනාථ කිරීමට **සිදත්සඟරා** අක්ෂර මාලාවේ අන්තර්ගත අක්ෂර සාධකව කරුණු කිහිපයක් ඉස්මතු කොට දක්වා ඇත.

1. මහාප්‍රාණ හා
2. ඇ, ඈ ඌන මාත්‍රය ඇතුළු නොකිරීම
3. දීර්ඝාක්ෂර හා බින්දුව ඇතුළු කිරීම

විශේෂයෙන් ම ශිලා ලේඛන ඇසුරෙන් කරුණු පැහැදිලි කරමින් පෙන්වා දෙන්නේ සම්ප්‍රදායට අනුගත වීම මත මහාප්‍රාණ, ඇ, ඈ, ඌන මාත්‍රය **සිදත්සඟරා** කතුවරයා ඇතුළු කොට නොමැති බව ය.

මේ අනුව සිදතට මුල් වූ ක්‍රි. 7 ශ. ව.ට පෙර හෝඩිය මහා ප්‍රාණ වියුක්ත විය. සිදත ද ඒ අනුව ගියේ ය.

> ''ක්‍රි. 10 වන ශත වර්ෂය වන විට බින්දුව හා එහි උනු මත් (සඤ්ඤකය) සිංහලයෙහි ඇතත් දුර්ලභ විය. ක්‍රි. 7 ශ. ව.ට පෙර එහි සංකෙත භාෂාවෙහි නො වී ය. සිදත් කතුතුමා 'ඇ', 'ඈ' සංකෙත මෙන් ම බින්දු ඌනමාත්‍රය ද අක්ෂර මාලාවට ඇතුළත් නොකළේ එම සංකෙත ද සිදතට මුල් වූ ක්‍රි. 7 ශ. වර්ෂයට පෙර ව්‍යාකරණ සම්ප්‍රදායේ නොපැවති නිසා ය. වෙනත් අකුරක විකෘතියක් සේ සැලකූ නිසා ය. එහෙත් සිදත ලියවුණු 13 වන ශ. වර්ෂයේ එම සංකෙත භාෂාවේ පැවැති නිසා ඒවා වෙනත් ව්‍යාකරණ ශීර්ෂ යටතේ ඉදිරිපත් කොට ඇත'' (2002: 82-83).

**සිදත්සඟරා** ආභාසයන් සැලකීමේ දී මහාප්‍රාණ **සිදත්සඟරාවට** මූලාශ්‍ර ග්‍රන්ථවල ද භාවිත වී නැත. එසේ ම දීර්ඝාක්ෂර හා බිංදුව අක්ෂර මාලාගත කිරීමට කාව්‍ය හා ලෝක ව්‍යවහාර නිදසුන් ද දක්වා වෙහෙසක් දැරීමට සිදුව ඇත්තේ ද සම්ප්‍රදායට පටහැනි වීමට පැවැති අසීරුකම නිසායැයි දක්වන විජයසූරිය ශිලා ලේඛන ඇසුරෙන් ද මේ අක්ෂර (ක්‍රි. ව. 7 වන සියවස තෙක්) භාවිතයේ නොපැවැති බව පෙන්වා දෙමින් (2002ඃ 82) තම මතය සනාථ කිරීමට උත්සාහ ගෙන තිබේ. මේ පිළිබඳ ව අධ්‍යයනයේ දී සඳහන් කළ හැකි වන්නේ දීර්ඝාක්ෂර හා බින්දුව අක්ෂර මාලාගත කිරීම සම්ප්‍රදායයෙන් බැහැරව ඉදිරිපත් වීමට පැහැදිලි නිගමනයන් **සිදත්සඟරා** කතුවරයා සතුව පැවැතුණත් ඇ, ඈ, ඌන මාත්‍රය, අක්ෂර උත්පත්තිය, නිර්මාණය, භාවිතයේ ස්වරූපය වැනි කරුණු සාධකව යම් ගැටලු සහගත බවක් පැවැති හෙයින් අක්ෂර මාලාවට ඇතුළු නොකොට වෙනත් විධි ක්‍රමවලින් භාෂාවේ පවතින බව පෙන්වා දී තිබෙන බවයි.

තම ඉදිරිපත් කිරීම් තහවුරු කිරීමට **සිදත්සඟරා** ලිංග විග්‍රහය යොදාගනිමින් ගෙනහැර දක්වන්නේ සිංහල භාෂාවේ ලිංග දෙකක් භාවිතය දඹදෙණි යුගයේ භාෂා සම්ප්‍රදායයේ වූවක් නොවන බවත් ප්‍රාකෘත යුගයේ පැවැති ලක්ෂණයක් බවත්ය.

> ''සිදත් සඟරා ව සංස්කෘත ආදියෙහි පුං, ස්ත්‍රී, නපුංසක ලිංගත්‍රය වෙනුවට පුම ඉතිරි ලිඟු දෙක පමණක් සිය බසෙහි වෙතැ යි දක්වයි. සිදත අනුව බඹ, සුර, අසුර වැනි සචේතන නාම මෙන් ම පත්, රිය, දිය, දල, රුවන්, පිරිකර වැනි අචේතන නාම ද පුල්ලිංග ය. රුවන් (< රතනං), පිරිකර (< පරික්ඛාරං) යන වචන මධ්‍යතන ඉන්දු ආර්ය භාෂාවල පුල්ලිංග නොව නපුංසක ලිංග ය. මාතෘ භාෂාවල පුල්ලිංග හා නපුංසක ලිංග ශබ්ද ගණ දෙක ම සිදත් සඟරාවේ පුල්ලිංග වෙයි.
>
> මෙය ද සිදත ලියූ (දඹදෙණි) කාලයේ භාෂා සම්ප්‍රදායයක් නොව සිංහල ප්‍රාකෘත යුගයේ පැවති ලක්ෂණයෙකි'' (2002ඃ 84).

මාතෘ භාෂා ඇසුරෙන් **සිදත්සඟරාවේ** ලිංග විග්‍රහයේ ස්වරූපය පැහැදිලි කරන විජයසූරිය සඳහන් කොට ඇත්තේ 'සිං. ප්‍රා. යුගයේ

සිංහලෙයේ පැවැති ලිංග (පුං-ස්ත්‍රී) ක්‍රමය සම්ප්‍රදායයක් වශයෙන් **සිදත් සඟරාව**ට මුල්වන්නට ඇති බව ඉතා පැහැදිලි ය.' (2002: 85) වශයෙනි. කෙසේ වුව ද **සිදත්සඟරා** ලිංග දැක්වීම පිළිබඳව අධ්‍යයනයේ දී හඳුනාගත හැකි වන්නේ අමිශ්‍ර සිංහල ව්‍යවහාරය එනම් පද්‍ය භාෂාව ඇසුරින් ලිංග දෙකක් දැක්වීමට **සිදත්සඟරා** කතුවරයා පෙළඹී ඇති බවයි (අභයසිංහ, ඒ. ඒ., 1998, 133). ඒ දහතුන්වන සියවස වන විට පද්‍ය භාෂාවේ ලිංග දෙකක් පමණක් භාවිත වීම හේතුකොට ගෙනය ඉහත කරුණු අධ්‍යයනයේ දී **සිදත්සඟරාවේ අක්ෂර මාලාව හා ලිංග භේදය** ඓතිහාසික වාග්විද්‍යාත්මක අධ්‍යයනයකට හසුකරන මහාචාර්ය විජයසූරිය වැදගත් කරුණු කිහිපයක් හෙළිදරව් කළ ද දහතුන් සියවසේ සිට වර්තමානය දක්වාම සිංහල භාෂාවේ ව්‍යාකරණ ප්‍රයෝග ඉගැන්වීමේ මෙන් ම ඉගෙන ගැනීමේ ව්‍යාකරණ කෘතිය බවට **සිදත්සඟරාව පත්ව තිබීම පාදක කොටගෙන එකහෙළා මේ කෘතියේ අඩුපාඩු දැක්වීම හෝ සමාජ සම්මතයෙන්** බැහැර **කිරීමට උත්සාහ දැරීම ගැටලුවකි.** විජයසූරිය 'අනුරූ සේපියෝනන්' **සිදත්සඟරා** දැක්වීම මත භාෂාවක ප්‍රයෝග දැක්වීමේ මෙන් ම විග්‍රහයේ නොවටිනාම පැත්ත යැයි සඳහන් කළ ද මේ සිද්ධාන්තයේ වැදගත්කම පෙනී යන්නේ සමකාලීන සමාජ පරිසරයට අනුගතව **සිදත්සඟරාව** අධ්‍යයනයේ දී ය. මාඝ ආක්‍රමණයෙන් පසුව රට සමාජ, සංස්කෘතික, දේශපාලන වශයෙන් පමණක් නොව ආර්ථිකයෙන් ද පරිහාණියට ලක්විය. වියත් සමාජය විනාශ වූ අතර අධ්‍යාපනය අඩාල විය. මාඝ වටිනා ග්‍රන්ථ විනාශ කළ අතර ප්‍රභූ සමාජය මිශ්‍ර සිංහලය පිළිගත්තහ. එවැනි සමාජ පරිසරයක **සිදත්සඟරාව** සම්පාදන කොට ඇත. සිංහල භාෂාවේ ව්‍යසනය හඳුනාගත් **සිදත්සඟරා** කතුවරයා භාෂාව ආරක්ෂා කරගැනීමටත්, සිංහල ජාතියේ අනන්‍යතාව තහවුරු කිරීමටත් **සිදත්සඟරාව** සම්පාදනය කළේය. එහි දී අවශ්‍යතාව මත පාලි, සංස්කෘත මෙන් ම දෙමළ භාෂා ආශ්‍රය ද ලබාගත්තේය. නමුත් සිංහල භාෂාවේ ව්‍යුහය තමා දැක්වූ ප්‍රයෝගවලට පමණක් සීමා වන බව හෝ එයින් බැහැරව යා නොහැකි බව **සිදත්සඟරා** කතුවරයා නොදැක්වීය. එමෙන් ම භාෂාවේ ව්‍යාකරණ රීති පිළිබඳ ව නිසි අවබෝධය වියතුන්ට ඇති බව දැන සිටි **සිදත්සඟරා** කතුවරයා වියත් දැක්වීම් හා ව්‍යවහාරය විමසා දැන ගැනීමට නිර්දේශ කළේ සිංහල භාෂාවේත්, ජාතියේත් ආරක්ෂාව උදෙසාය. වාග්විද්‍යාත්මක

විවිධ සිද්ධාන්ත හා සමකාලීන ව්‍යවහාරයන් ද උපයෝගී කොටගෙන භාෂාවේ ව්‍යාකරණ පද්ධතිය හඳුනා ගැනීමටත්, විග්‍රහයටත් හැකියාව ඇත. **සිදත්සඟරාව** භාෂාව හඳුනා ගැනීමට හෝ විග්‍රහයට ප්‍රාමාණික නොවේ යන මතයට වඩා වැදගත් වන්නේ එවැනි දේ කිරීමට භාෂාව ආරක්ෂා කර තිබීම බව වර්තමාන විද්වතුන්ට පෙනී යා යුතුය.

මහාචාර්ය විජයසූරිය ඓතිහාසික වාග්විද්‍යාත්මක සිද්ධාන්ත යොදාගෙන භාෂාව විමර්ශනයේ දී ශිලා ලේඛන මෙන් ම සාහිත්‍ය ග්‍රන්ථ මාලාව වැදගත් වන බව පෙන්වා දී ඇත්තේ **සිදත්සඟරාවේ ඒ භාවිතයන් ප්‍රතික්ෂේප කරමිනි.** සිදත්සඟරාවේ ඇතුළුව ඇත්තේ ද කාලීන අමිශ්‍ර සිංහල ග්‍රන්ථවල ඇතුළත් ව ඇති විවිධ ව්‍යාකරණ රීතියි. (**එළුසඳැස් ලකුණ, අසක්දාකව, කව්සිළුමිණ...**) පුරාණ සම්ප්‍රදාය භාෂාවේ සැබෑ ස්වරූපය හඳුනාගැනීමට පමණක් ද නොව විග්‍රහයට ද (අක්ෂර, පද, අර්ථ හා ප්‍රකරණ) වැදගත් වෙයි. මේ කරුණු සැලකීමේ දී වැදගත් යැයි පෙනී යන්නේ **සිදත්සඟරා** ඌනතා සොයා හෙළිදරව් කිරීමකට වඩා **සිදත්සඟරාවේ** ව්‍යාකරණ පද්ධතියේ ද ඇසුර ලබා අවශ්‍යතාව පාදක ව කාලීන ව්‍යාකරණ ග්‍රන්ථ සම්පාදනය කිරීමය. එහි දී වැදගත් වන්නේ **සිදත්සඟරා** කතුවරයා අනුගමනය කළාක් මෙන් ජ්‍යෙෂ්ඨ ව්‍යවහාරය මෙන් ම කාලීන වියත් ව්‍යවහාරයට අනුගත වීම හෝ ඒ ව්‍යවහාරය විමසා ව්‍යාකරණ රීති හඳුනාගැනීම හෝ ගැටලු විසඳා ගැනීමය. එසේ නමුදු වර්තමානයේ වුව ද බොහෝ ව්‍යාකරණඥයන්ගේ ව්‍යාකරණ ග්‍රන්ථ සැකසී ඇත්තේ **සිදත්සඟරාව** මූලාශ්‍රය කරගෙනය. ඒ රාමුවට සීමා වීම මත වර්තමාන අවශ්‍යතා මුල්කරගෙන කාලීන ව්‍යාකරණ පද්ධතියක් සිංහල භාෂාවට ගොඩනැඟීමෙන් බැහැර ව සිටීමත්ය.

ඓතිහාසික වාග්විද්‍යාත්මක සිද්ධාන්තවලට අනුව ව්‍යාකරණ ග්‍රන්ථයක් වශයෙන් **සිදත්සඟරාවේ** ඌනතා කිහිපයක් විග්‍රහයට විජයසූරිය හසුකර තිබුණ ද ඒ අතර කැපී පෙනෙනනේ **සිදත්සඟරා ඇතැම් ව්‍යාකරණ රීති සම්මතකරණය කර තිබීම ය.** කෙසේ වුවද විසිවන හා විසි එක්වන සියවසේ ජීවත් වූ මෙන් ම ජීවත් වන අප **විසින් සිදත්සඟරාවේ අඩුපාඩු දක්වනු ලබන්නේ සිදත්සඟරාව යනු කුමක් දැයි හරිහැටි වටහා නොගෙන බව සිදත්සඟරාව පදනම්**

**කරගෙන බිහිව ඇති විවිධ ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ලිපි ලේඛනවල ඇතුළත් කරුණු අධ්‍යයනයෙන් පැහැදිලි වෙයි.**

ආශ්‍රිතයන්ඃ


1. අදිකාරි, ඒ. (1994). 'සම්භාව්‍ය ලේඛන හා ව්‍යාකරණ සම්ප්‍රදායයෝ' **සම්භාෂා.** චතුර් මාසික අධ්‍යයන සංග්‍රහය - කලාපය - 6. බත්තරමුල්ලඃ පිරිවෙන් හා ආගමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව. 87-23.
2. අභයසිංහ, ඒ. ඒ. (1989). 'සිංහල ගී කවියේ භාෂාව - හැඳින්වීමක්' **භාෂා විඥාන. භාෂා විෂයක ලිපි සංග්‍රහය** - 1. රදාවානඃ අබයරත්න මුද්‍රණාලය. 80-109.
3. ——— (1998). **ව්‍යාඛ්‍යාන සහිත සිදත් සඟරාව.** කඩවතඃ අභය මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ. ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය.
4. ඒකනායක, පුංචිබණ්ඩා. (1996). 'සිංහලයේ දේශීය අනන්‍යතාව ප්‍රකට කරන වර්ණමාලාව' **සම්භාෂා.** කලාපය - 7. බත්තරමුල්ලඃ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව. 137-144.
5. කරුණාතිලක, ඩබ්ලිව්. එස්. (1995). **සිංහල භාෂා ව්‍යාකරණය.** (පස්වන මුද්‍රණය - 2004). කොළඹඃ ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
6. කුමාරණතුංග, මුනිදාස. (1935). **සිදත් සඟරා විවරණය.** (ප්‍රථම භාගය). කොළඹඃ කේ. ඩී. පෙරේරා සහ පුත්‍රයා.
7. ——— (2508). කුමාරණතුංග, මුනිදාස හා ගුණවඩුන්න, අමරසිරි. **සිදත් සඟරා විවරණය.** කොළඹඃ අනුල පහරුවෙහි.
8. කුලසූරිය, ආනන්ද. (1994). 'සිදත් සඟරාවේ විභක්ති සංකල්පය' **චින්තක.** ශාස්ත්‍රීය සංග්‍රහය. දහවන කලාපය. කැලණියඃ කැලණිය විශ්වවිද්‍යාලයීය මහා ශිෂ්‍ය සංගමය. 87-89.
9. ගුණවර්ධන, ඩබ්ලිව්. එෆ්. (1924). **සිද්ධාන්ත පරීක්ෂණය හෙවත් ස්වභාෂා නීතිසාරය.** කොළඹඃ එන්. ජේ. කුරේ. (දෙවන මුද්‍රණය - 1959). කොළඹඃ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.
10. ඤාණාලොක, කෝදාගොඩ. (1962-1963). 'සිදත් ගැට තුනක්' **සිංහල සඟරාව.** 3 කලාපය. 96-105.
11. ද සිල්වා, ම. ව. සුගතපාල. (1963). **භාෂා විමර්ශනය.** මහරගමඃ සමන් ප්‍රකාශකයෝ.
12. ——— (1963). **විග්‍රහාත්මක වාග්විද්‍යාව.** කොළඹඃ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.
13. ද සිල්වා. (1969). 'සිංහල භාෂාවේ ප්‍රශස්ත ව්‍යාකරණ ග්‍රන්ථයක් - සිදත් සඟරාව.' **ලංකාවේ අධ්‍යාපනය** 1 'සියවස ප්‍රකාශනය' අධ්‍යාපන සහ සංස්කෘතික අමාත්‍යාංශය. 195-200.
14. ධම්මරතන, හිස්සැල්ලේ. (1963). **සිංහලයේ ද්‍රවිඩ බලපෑම්.** කොළඹඃ අනුල මුද්‍රණාලය.

15. ——— (1964). 'සිංහලයේ ද්‍රවිඩ බලපෑම්' (ප්‍රාචීන ශාස්ත්‍රීය සංග්‍රහය). **සම්භාෂා.** 12 වැනි කලාපය - 2002. කොළඹ: අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව. 96-100.
16. **සිදත්සඟරා විස්තර සන්නය**. (1902). ධර්මාරාම, රත්මලානේ. (සත්වන මුද්‍රණය). කැලණිය:
බලගල්ලේ, විමල් ජී. (1995). **භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය**. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
17. ——— (1998). **සිංහල භාෂාධ්‍යයන ඉතිහාසය**. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
18. විජයසූරිය, විමල. (1965). 'ඓතිහාසික වාග්විද්‍යාවෙන් සිදතට එළියක්' (ප්‍රාචීන ශාස්ත්‍රීය සංග්‍රහය). **සම්භාෂා 12 වැනි කලාපය - 2002**. බත්තරමුල්ල: අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව. 72-85.
19. ——— (1968). 'ලිංග භෙදයත් සමඟ සිංහල ස්ත්‍රී ප්‍රත්‍යයයේ විකාශය' **විද්‍යොදය: විද්‍යා කලා භාෂා ශාස්ත්‍රීය සංග්‍රහය**. වෙළුම 1. අංක 1. නුගේගොඩ: ශ්‍රී ලංකා විද්‍යොදය විශ්වවිද්‍යාලීය ප්‍රකාශනය. 67-78.
20. ——— (1969). 'සිදත්සඟරාව පද්‍යකරණය සඳහා ලියූ අත්පොතක් ද?' **විද්‍යොදය: විද්‍යා කලා භාෂා ශාස්ත්‍රීය සංග්‍රහය**. Vol: 2. No. 2. 111-124.
21. Auty, R. (1973). 'The role of purism in the development of the Slavonic literary Languages' *Slavonic and East European Review 51*: pp 335-343.
22. Crystal, D. (1997). *The Cambridge Encyclopedia of Language*. Cambridge: Cambridge University Press.
23. ——— (1999). *The Penguin Dictionary of Language*. Harmondsworth: Penguin. Crystal,David.
24. *Chülavamsa*. (1925). Geiger, W. (1927 2nd) London. PTS.
25. Milroy, J. and Milroy, L. (1999). *Authority in Language*. Investigating Standard English(3rd ed.). London: Routledge.
26. Nahir, Moshe. (1974). 'Language Academics, Language Planning, and the Case of the Hebrew Revival.' Dissertation, University of Pittsburgh.
27. ——— (1977). 'The Five Aspects of Language Planning: A Classification.' *LPLP*. 1/2: 107-123.
28. ———(1984). 'Language Planning Goals: A Classification' *Language Problems and Language Planning*. 8: 3. pp. 294-327. Reprinted in Paulston. C. B. & Tucker, G. R. (eds.). (2003). *Sociolinguistics: The Essential Readings*. London: Blackwell. 423-448.